# කඩිගමුව නාගවනාරාමය මූලික ගවේෂණය

යූ. ජී. අජිත් සෝමරත්න

පුරාවිද්‍යා අධ්‍යයන අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
ugajithsomarathna@gmail.com

කඩිගමුව නාගවනාරාම පුරාවිද්‍යා ස්ථානය කෑගල්ල දිස්ත්‍රික්කයේ රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කඩිගමුව ග්‍රාමසේවා වසමට අයත් ව පිහිටා තිබේ. මෙම පුරාවිද්‍යා ක්ෂේත්‍රය වැදගත් වන්නේ ටැම්පිට විහාර සම්ප්‍රදායට අයත් ගොඩනැගිලි තුනක් පැවතීම හේතුවෙනි. ඉකුත් සියවසේ මුල්භාගයේ සිට තත් පුරාවිද්‍යා ක්ෂේත්‍රය වාර්තාකරණයට ලක් වුව ද එහි ඓතිහාසික, පුරාවිද්‍යාත්මක වැදගත්කම් මේ දක්වා අවධාරණය වී ද යන්න ගැටලුවකි.

තත් පුරාවිද්‍යා ක්ෂේත්‍රයේ ද්වාර මණ්ඩපය, නව විහාර මන්දිරය, නව සංඝාවාසය, ධර්ම ශාලාව සහ අතිරේක කුටි, චෛත්‍යගරයක් සහිත චෛත්‍ය, ටැම්පිට විහාර දෙකක්, පොත් ගුලක්, බෝමැඩ සහ බෝධිමළුවක් සහ පත්තිනි දේවාලය යන වාස්තු විද්‍යාත්මක නිර්මාණ හඳුනාගත හැකිය. මෙහි ආරම්භය වත්හිමි බුවනෙකබා රජු සමයට අයත් වන බව විහාරගෙයි තිබෙන බිත්ති ලිපිය සාක්ෂි සපයයි. එනම් මෙහි ආරම්භය කුරුණෑගල සමයට අයත් වන බව ගම්‍යමාන වෙයි. එසේ ම වරින් වර රාජ්‍ය අනුග්‍රහයන් යටතේ විවිධ සංවර්ධන කටයුතු කර තිබෙන බවට වාර්තා හමුවෙයි. නමුත් බෙල් වාර්තාවල ඇති කරුණුවලට අනුව මෙය 16 වන සියවසට පමණ අයත් බව පෙනේ. ඉදිකිරීම් වර්ෂ පිළිබඳව විහාර බිත්ති ලිපිය සහ මෙම වාර්තාවල යම් නොගැලපීමක් අවබෝධ විය. මීට අමතර ව විහාරයේ කැපී පෙනෙන නිර්මාණයක් වන ටැම්පිට විහාර ද්විත්වය පිළිබඳව තවදුරටත් අධ්‍යයනය කිරීමට අදහස් කරමි.

එබැවින්තත් පුරාවිද්‍යා ක්ෂේත්‍රය පිළිබඳ ව අධ්‍යයනය කිරීමට බලාපොරොත්තු වන්නේ ටැම්පිට විහාරය ඉදිකිරීම් සම්ප්‍රදායේ දී නාගවනාරාමයේ ඇති වැදගත්කම සහ විහාර බිත්ති ලිපියේ දැකිය හැකි ගැටලු සහගත රාජ්‍ය වර්ෂ පිළිබඳව ය. ඉදිරියේදී කිරීමට බලාපොරොත්තු වන විමර්ශනයෙන් මේ පිළිබඳව නිසි අධ්‍යයනයකට පැමිණීමට අපේක්ෂා කෙරේ.